00005

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන -පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**අධ්‍යාපනයේ උපදේශනය හා මාර්ගෝපදේශනය – ESU3128**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 07** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. උපදේශනය හා මාර්ගෝපදේශය අතර වෙනස්කම් තුනක් (03) පැහැදිලි කරන්න.

02. ළමයින් තුළ පවතින සමායෝගී ගැටලු සමාජ ගැටලුවක් බවට පත්වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03. නිරීක්ෂණ සැසියක් පැවැත්වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පහක්(05) දක්වන්න.

04. අතාර්කික/ අහේතුවාදී සිතිවිලි සහිත සිසුවෙකුට ඔබ සහාය වන්නේ කෙසේදැයි උදාහරණයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

05. ළමයින්ගේ අනාගත වෘත්තිය තේරීම පිළිබඳ ඈන් රෝගේ න්‍යායෙහි අඩංගු මූලික අදහස සාරාංශගත කරන්න.

06. පාසල් උපදේශනය නම්‍යශීලී විය යුත්තේ මන්දැයි උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

07. ඉගෙනුම් දුෂ්කරතාවට බලපෑ හැකි හේතු පහක්(05) ලැයිස්තුගත කරන්න.

08. පන්ති කාමරවල සිටින ඉහළ හා සහජ දක්ෂතා සහිත සිසුන්ට පහසුකම් සැපයීමේ වැදගත්කම පිළිබඳව කෙටියෙන් අදහස් දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. I. ළමයින් තුළ පවතින සමායෝගී ගැටලු පිළිබඳව ගුරුවරුන් දැනුවත් විය යුත්තේ මන් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ළමයින් තුළ පවතින සමායෝගී ගැටලු සඳහා පවුල ආශ්‍රිත අවිඥානික සාධක බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. I. උපදේශනය සහ මාර්ගෝපදේශය යන සංකල්පවල පරිණාමය පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ලෝකයේ සමාජ ආර්ථික වෙනස්කම් සමඟ මතු වූ උපදේශනයේ නව අංශ මොනවාදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10)

11. I. ළමයින් පෙන්වන විනාශකාරී චර්යාවන්හි සෘණාත්මක බලපෑම් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ඉහත සඳහන් චර්යා ගැටලු මඟහරවා ගැනීමට ගත හැකි පියවර උදාහරණ ආශ්‍රිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. I. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට ඇති විය හැකි චර්යා හා චිත්තවේගික ගැටලු සඳහා බලපෑ හැකි හේතු දෙකක් (02) දක්වන්න. (ලකුණු 10)

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ දෙමාපියන් සඳහා උපදේශන හා මාර්ගෝපදේශ සේවයක අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. I. උපදේශනය තුළ ඇති පසු විපරම් ක්‍රියාවලියේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. ළමයින් පාසලින් වැඩ ලෝකයට සංක්‍රමණය කරවීම සඳහා පාසලක උපදේශන හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයකට ගත හැකි පියවර මොනවා ද? (ලකුණු 10)

14. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

i. උපදේශනයේ සච්චාරිත්‍ර ධර්මවල වැදගත්කම

ii. රැකියා නියුක්තිකයන්ට වෘත්තිය මාර්ගෝපදේශයේ අවශ්‍යතාව

iii. උපදේශනය ඉගෙනුම් ක්‍රියාවලියකි

iv. සමායෝගි ගැටලුවලට බලපාන හේතුවක් ලෙස කාංසා අක්‍රමතා

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.